**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - 2019**

---

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ (ප්‍රදාන) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මාස 13 ½ ක කාලපරිච්ඡේදයක් සඳහා වන මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 11 දින එළඹි අංක 9193 එස්ආර්අයි (ඊඑෆ්) දරන ප්‍රදාන ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.02(අ) වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය**

---

වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, එවකට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එනම් වත්මන් අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර අනෙකුත් ආයතන 10 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. (අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශය වෙත පෞද්ගලික අංශයේ දායකත්වය වැඩි කිරීම (ආ) ස්වයං රැකියාවන් සඳහා කාන්තාවන් ඉලක්ක කර ගත් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරීම (ඇ) සාම්ප්‍රදායික නොවන අංශ වෙත කාන්තාවන් ආකර්ශනය කර ගැනීම සඳහා ඉලක්කගත දිරිගැන්වීම්, උපදේශනය සහ රැකියා මත පුහුණුව ලබා දීම සහ (ඈ) පෞද්ගලික අංශය තුළ ස්ත්‍රී පුරුෂ බඳවා ගැනීම් හා වැඩ කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම වැඩසටහනේ අරමුණු වේ. ගිවිසුම ප්‍රකාරව වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 534 කට සමාන එජඩො මිලියන 3 ක් වූ අතර දරිද්‍රතාවය අවම කිරීම සඳහා වන ජපන් අරමුදල විසින් ප්‍රදානයක් ලෙස ලබා දීමට අපේක්ෂිත වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් එහි පරිපාලන කටයුතු සිදු කරනු ලබයි. වැඩසටහන එහි කටයුතු 2018 වර්ෂයේ නොවැම්බර් 16 ආරම්භ කරන ලද අතර 2021 මාර්තු 31 වනවිට නිම කිරීමට නියමිතය.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනෙහි (ප්‍රදාන) සාරාංශ වියදම් ප්‍රකාශනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස 13 ½ ක කාලපරිච්ඡේදය සඳහා පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශනය සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනකාරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩසටහන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

වැඩසටහන වාර්ෂික හා කාලීන වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සමස්ත ඉදිරිපත් කිරීම ඇතුළත් වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් වියදම් පිළිබඳ සාරාංශ ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගනන විෂය පථයද පුළුල් කර ඇත.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව වගකීම් දරන්නන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (ප්‍රදාන) ගිවිසුමෙහි IV ව්‍යවස්ථාවෙහි 4.02(අ) වගන්තිය ප්‍රකාරව වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු වන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසින් පිළිගෙන ඇති මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුවය. ඊට අමතරව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 30/94 හා 1994 අප්‍රේල් 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව විදේශ ප්‍රදාන හා ණය සම්බන්ධ වාර්ෂික ගිණුම්, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ උපචිත පදනම මත පිළියෙළ කළ යුතු වේ. කෙසේ වුවද, 2019 දෙසැම්බර් 31 වෙනි දිනට වැඩසටහන විසින් මූල්‍ය ප්‍රකාශන එජඩො වටිනාකම් මත පදනම්ව මුදල් පදනම මත පිළියෙළ කර තිබූ අතර වියදම් ප්‍රකාශයේ සාරාංශයක්, මුදල් ලැබීම් හා ගෙවීම් ප්‍රකාශයක් සහ අයවැය සමග සත්‍ය වියදම් ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළින් වැඩසටහනෙහි මූල්‍ය තත්ත්වය පිළිබිඹු නොකෙරුණි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල 4 වන ජේදයේ අනාවරණය කර ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සහ මුදල් පදනම මත පිළියෙළ කර ඇත. මෙය නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (ප්‍රදාන) ගිවිසුමෙහි 4 වන ව්‍යවස්ථාවේ 4.02(අ) ජේදයට අනුකූල වේ. ආසියානු සංවර්ධන බැංකුවෙහි අවශ්‍යතාවය පරිදි ව්‍යාපෘතියක මූල්‍ය ප්‍රකාශනතුල පහත අංගයන් අන්තර්ගත විය යුතුය.<br>- මුදල් ලැබීම් හා ගෙවීම් ප්‍රකාශය<br>- අයවැය සමග සත්‍ය වියදම් ප්‍රකාශය<br>- අග්‍රිම ගිණුම (අදාල වේ නම්)<br>- වියදම් සාරාංශ වාර්තාවක් (අදාල වේ නම්)<br>- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන්<br>- එකඟ වූ පරිදි අනෙකුත් අතිරේක ප්‍රකාශනයන් (උදා: වියදම් සාරාංශය)<br>ඒ අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අවශ්‍යතාවය සමග එකග වේ. | වැඩසටහනෙහි ගිවිසුම් ප්‍රකාරව සහ පොදු අවශ්‍යතාවය පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ආ) | වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ලෙහි ජේද අංක 20 ප්‍රකාරව ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ප්‍රතිපාදනයන් ගිණුම්ගත කිරීම සඳහාත් එම ප්‍රතිපාදනයන් මත කරන | මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇති ගණුදෙණු වල නිරවද්‍යතාවය සත්‍යාපනය කළ | ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා නියෝජිතායතනය විසින් ව්‍යාපෘතියේ මූලික අදියරේදී පොදු බැංකු ගිණුමක් භාවිත කර තිබුණි. | වැඩසටහනෙහි මූල්‍ය ගණුදෙණු සඳහා වෙනම බැංකු ගිණුමක් ආරම්භ කළ |

| | | | |
|---|---|---|---|
| මූල්‍ය ගණුදෙණු ගිණුම් තැබීම සඳහාත් වෙනම බැංකු ගිණුමක් පවත්වා ගත යුතු බවට විධිවිධාන දක්වා ඇති අතර 2019 මැයි 13 පැවති මූල්‍ය රැස්වීමේදී ද මාසික බැංකු සැසඳුම් වාර්තා ව්‍යාපෘති කාර්යාලයට ඉදිරිපත් කළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුවද, විගණිත දිනය වූ 2020 ඔක්තෝබර් 17 දින දක්වා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ඉහත කාර්යයන් සඳහා වෙනම බැංකු ගිණුමක් ආරම්භ කර නොතිබුණි. | නොහැකි විය. | කෙසේවුවද, 2020 පෙබරවාරි සිට අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත වෙනම ගිණුමක් විවෘත කර ඇත. තවද, ව්‍යාපෘතියේ නව ක්‍රියාත්මක කිරීමේ පාර්ශවය ලෙස ඔක්ස්ෆෑම් ආයතනය විසින් 2020 ඔක්තෝබර් 06 වන දින සිට ව්‍යාපෘතිය සඳහා වෙනම බැංකු ගිණුමක් ආරම්භ කර ඇත. | යුතුය. |

## 2.2 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

---------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| -------- | -------------------------- | ------------- | ------------------ | --------------- |
| මූල්‍ය හා සැලසුම් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2007 අගෝස්තු 07 දිනැති අංක MOFP/ERD/2007/2 දරන චක්‍රලේඛය ප්‍රකාරව වැඩසටහනෙහි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2020 මාර්තු 31 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වේ. | වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 17 දින ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**2.3 මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් ප්‍රමාදයන්**

| අංකය | ආපසු ලබාගැනීමේ අයදුම්පත් | කාලපරිච්ඡේදය | ඉදිරිපත් කළ දිනය | ප්‍රමාද වූ දින ගණන | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| i | 01 | 2018 දෙසැම්බර් සිට 2019 මාර්තු | 2019 අගෝස්තු 02 | දින 124 | වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වේ. | ප්ලෑන් ඉන්ටර්නැෂනල් ඕස්ට්‍රේලියා ආයතනය විසින් 2020 මාර්තු 26 දින වන විට එකතුව එජඩො 109,837.91 ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් ප්‍රතිපූර්ණය කර තිබුණි. | මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් නියමිත වේලාවට ඉදිරිපත් කිරීමට කළමනාකරණය අවශ්‍ය පියවර ගත යුතුය. |
| ii | 02 | 2019 අප්‍රේල් සිට 2019 ජූලි | 2019 දෙසැම්බර් 24 | දින 146 | | | |
| iii | 03 | 2019 අගෝස්තු සිට 2019 දෙසැම්බර් | 2020 මාර්තු 02 | දින 62 | | | |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

2019 දෙසැම්බර් 31 දිනට

| අංකය | අපේක්ෂිත භෞතික ප්‍රගතිය<br>ඒකක/ප්‍රතිශතය | ළඟාකරගත් කාර්ය සාධනය<br>ඒකක/ප්‍රතිශතය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ පුහුණුව සම්පූර්ණ කිරීම සඳහා 6524 දෙනෙකු සහභාගී වී තිබුණි. | සහභාගීවූවන් 5053 ක් පමණක් පුහුණුව සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව හැරයාමේ අනුපාතය සියයට 23 කි. පුහුණු මධ්‍යස්ථාන 16 ක පවත්වන ලද පුහුණු පාඨමාලා 18 ක පුහුණුවන්නන් ප්‍රතිශතය සියයට 50 සිට සියයට 100 දක්වා පරාසයක් තුළ පාඨමාලා සම්පූර්ණ නොකර අතරමග නවතා දමා තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. | අපේක්ෂිත අරමුණු නියමිත කාලය තුළ ළඟාකර ගැනීමට නොහැකිවීම | සටහන් කර ඇත. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පුහුණු කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරීත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | වැඩසටහනේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො 462,060 කින් අපේක්ෂිත ප්‍රතිලාභයන් 4 ක් යටතේ ක්‍රියාකාරකම් 19 ක් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එජඩො 31,823 ක පිරිවැයක් දරා ක්‍රියාකාරකම් 07 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | වැඩසටහනේ අපේක්ෂිත අරමුණු ළහාකරගත නොහැකි වීම. | සටහන් කර ඇත. | වැඩසටහනේ කාලපරිච්ඡේදයෙන් අඩකට වඩා දැනටමත් අවසන් කර ඇති බැවින් අපේක්ෂිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට ඉක්මන් පියවර ගත යුතුය. |
| (ඇ) | මෙම වැඩසටහනේ ප්‍රධානතම අරමුණ ශ්‍රී ලංකාවේ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශයේ කාන්තාවන් සවිබලගැන්වීම වේ.<br>වැඩසටහනේ අරමුණු ළහාකරගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ පුහුණු මධ්‍යස්ථාන 84 ක පවත්වන ලද වැඩසටහන් 226 ක් සඳහා පුහුණුවලාභීන් 6524 ක් සහභාගී කර තිබුණි. එම පුහුණු වැඩසටහන් සඳහා මුළු සහභාගීවන්නන්ගෙන් සියයට 24 ක ප්‍රමාණයක් එනම් කාන්තාවන් 1543 ක් පමණක් සහභාගී වී තිබුණි. තවද වැඩසටහන් 226 ක් පවත්වන ලද බව නිරීක්ෂණය විය. පවත්වන ලද පුහුණු වැඩසටහන් 110 ක් සඳහා කිසිඳු කාන්තා සහභාගීත්වයක් නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. | වැඩසටහනේ ප්‍රධාන අරමුණ ඉටු කරගත නොහැකි වීම. | සටහන් කර ඇත. | වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිලාභය ලබාගැනීම සඳහා වැඩසටහන් අධීක්ෂණ ඒකකය විසින් උපදේශකවරුන් සමග සමීප අධීක්ෂණයක් හා සම්බන්ධිකරණයක් පවත්වා ගත යුතුය. |